(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(18).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජනවාරි 12 සිකුරාදා**

---

**2024 ජනවාරි 23 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කාලාවරෝධ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

උකස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 නොවැම්බර් 01 දිනැති අංක 2356/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 1),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වගන්තිය සමඟ කියවිය යුතු 60 වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජූලි 30 දිනැති අංක 2238/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 2),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වගන්තිය සමඟ කියවිය යුතු 60 වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග (අංක 3),— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විමසා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 14 දිනැති අංක 2362/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2024 ජනවාරි 24 බදාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2024 පෙබරවාරි 06 අඟහරුවාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2024 පෙබරවාරි 09 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 11/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව

සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාසල් සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීම,— පාසල් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන වාර්ෂිකව දෙමව්පියන්ගෙන් අයකර ගැනීම අඛණ්ඩව සිදුවන හෙයින් ද, වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇතැම් දෙමව්පියන් හට එම මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට අපහසු වීම හේතුවෙන් එකී දෙමව්පියන්ගේ දරුවන් පන්ති කාමර තුළ දී අපහසුතාවයන්ට ලක්වීමට ඉඩ ඇති හෙයින් ද, පාසල් සංවර්ධන කටයුතුවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගත යුතු ආකාරයත්, එම මූල්‍ය අයවැය වාර්තා ප්‍රදර්ශනය කළ යුතු ආකාරයත්, එකී සංවර්ධන කටයුතු සඳහා පසු විපරම් කටයුතු කළ යුතු ආකාරයත් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2023

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා,— ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීම,— වසර ගණනාවක් එකම පාසලක් තුළ සේවය කිරීම හේතුවෙන් ගොඩනැගෙන පෞද්ගලික සබඳතා හේතුවෙන් ඇතැම් ළමුන් හට යම් යම් අවස්ථාවල දී අසාධාරණකම් ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ ස්ථරවල ළමයින් සමඟ සේවය කිරීම මඟින් ළමා මනස අවබෝධ කරගැනීමේ හැකියාව හා අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවන හෙයින් ද, දේශපාලන, සමාජීය සම්බන්ධතා හේතුවෙන් ස්වාධීන අධ්‍යාපන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට අවහිරතා ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ උප සංස්කෘතීන් අවබෝධ කර ගැනීමට ඇති අවස්ථා ගිලිහී යන හෙයින් ද, විවිධ ප්‍රාදේශීය භාෂාවන් සහ ප්‍රාදේශීය සංස්කෘතීන්ගෙන් අත්දැකීම් ලබා ගැනීමට ඇති අවස්ථා අල්ප වන හෙයින් ද, අධ්‍යාපනය ලබාදීම සහ යහපත් සමාජ පුරවැසියකු බිහි කිරීම යන ඒකායන අරමුණ ඉටුවන අධ්‍යාපන ක්‍රමවේදයක් ඇති කිරීම උදෙසා සියලුම ගුරුවරුන් හට වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබා දීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— රජයේ ආයතන සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකීමක් සහිත වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම,— අතීතයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් කාර්යාල උපකරණ සඳහා යොදා ගනු ලැබූ දැව භාණ්ඩ දීර්ඝ කාලයක් භාවිත කළ ද වර්තමානයේ දී එම ආයතන භාවිත කරන කාර්යාල උපකරණ ප්ලයිවුඩ් ෂීට් හා අනෙකුත් කෘත්‍රිම ෂීට් වර්ග යොදා සකස් කරන හෙයින් ඉතා කෙටි කාලයකින් ඒවා විනාශ වන හෙයින් ද, මෙම වත්මන් කාර්යාල උපකරණ සකස් කිරීම සඳහා විදේශ රටවලින් අමුද්‍රව්‍ය ආනයනය කිරීම හේතුවෙන් විශාල වශයෙන් විදේශ රටවලට මුදල් ගලායාම සිදුවන හෙයින් ද, අපගේ පරිසර පද්ධතියට ඉවතලන මෙම ද්‍රව්‍යවලින් දැඩි බලපෑමක් එල්ලවන හෙයින් ද, රජයේ ආයතන සඳහා  රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකිවයුතු වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාරම්පරික දේශීය එළවළු හා පලතුරු බීජ නැවත ප්‍රවර්ධනය කිරීම,— අප රටේ පාරම්පරික එළවළු හා පලතුරු බීජ වර්ග වර්තමානය වනවිට හිඟ වීම හේතුවෙන් විදේශ රටවලින් බීජ ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය වන හෙයින් ද, එසේ ගෙන්වනු ලබන බීජවලින් ලැබෙන එළදාවෙන් ලබා ගන්නා බීජ නැවත රෝපණය වීමේ හැකියාවෙන් තොර හෙයින් ද, පාරම්පරික දේශීය බීජ වර්ගවලින් හටගන්නා එළදාව කෘමි උවදුරුවලට ඔරොත්තු දීමේ විශේෂ හැකියාවකින් යුක්ත වන හෙයින් ද,  වර්තමානය වනවිට ශ්‍රී ලංකාවෙන් ක්ෂය වෙමින් පවතින පාරම්පරික දේශීය එළවළු හා පලතුරු බීජ නැවත ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— වෘත්තිකයන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීමට වෘත්තීය පුහුණු විෂයභාර අමාත්‍යාංශයට අනුයුක්ත ආයතනයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ වෘත්තීන්වල යෙදෙන පුද්ගලයන් අතර ආයතනවලින් පුහුණුවූවන් මෙන්ම සහජ හැකියාවෙන් එම වෘත්තීන්වල යෙදෙන්නන් සිටින හෙයින් ද, පෙදරේරු, ලී වැඩ, මෝටර් කාර්මික වැද්දුම්, පින්තාරු ආදී ක්ෂේත්‍රවල යෙදෙන්නන් ලියාපදිංචි කිරීමේ ආයතනයක් නොමැති බැවින් එකම පුද්ගලයා වෘත්තීන් කිහිපයක යෙදෙන බැවින් ද, වෘත්තිකයකු හදිසි අනතුරකට මුහුණ දී ඇති අවස්ථාවක දී වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ පහසුව සඳහා එම පුද්ගලයාගේ රුධිර වර්ගය පිළිබඳ තොරතුරු සහ සේවාව ලබා ගන්නා පුද්ගලයාට වෘත්තිකයාගේ අනන්‍යතාවය තහවුරු වන තොරතුරු ඇතුළත් වෘත්තීය හැඳුනුම්පතක් ලබාදීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින් ද, වෘත්තිකයන් ලියාපදිංචි කර ඔවුන්ට හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා වෘත්තීය පුහුණු විෂයභාර අමාත්‍යාංශයට අනුයුක්තව ආයතනයක් ස්ථාපනය කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— ඒකාබද්ධ සේවයේ සහ දීප ව්‍යාප්ත සේවයේ නියුතු නිලධාරින් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීම,— රාජ්‍ය සේවය තුළ ඒකාබද්ධ  සේවය හා දීප ව්‍යාප්ත සේවාවල නියුතු නිලධාරින් එක් ස්ථානයක වසර පහකට අධික කාලයක් සේවය කිරීම හේතුවෙන් ඔවුන්ට ලබාගත හැකි අත්දැකීම් හා විශේෂ ප්‍රාගුණ්‍යය පිළිබඳ දැනුම හීනවන බැවින් ද, කලකිරීම් හා මානසික

පීඩාවන් අවම වී ප්‍රබෝධමත්, උද්යෝගිමත් හා නැවුම් මානසිකත්වයකින් රාජකාරි කිරීමට ඇති අවස්ථා අහිමිවන බැවින් ද, ඇතිවන සමාජ අන්තර් සම්බන්ධතා මඟින් අක්‍රමිකතා, වංචා හා දූෂණ සඳහා පෙළඹවීමක් ඇති විය හැකි හෙයින් ද, දේශපාලන හා සමාජීය සම්බන්ධතා හේතුවෙන් ස්වාධීන සේවාවක් පවත්වාගෙන යාමට අවහිරතා ඇතිවිය හැකි හෙයින් ද, ප්‍රාදේශීය පරිපාලනයේ විවිධ අත්දැකීම් බහුලවීමේ සාධනීය බලපෑම අල්පවන හෙයින් ද, කාර්යක්ෂම හා ප්‍රශස්ථ රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම උදෙසා ඒකාබද්ධ සේවයේ සහ දීප ව්‍යාප්ත සේවයේ නියුතුවන නිලධාරින් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාසල් සිසුන් සතියේ එක් දිනක් බාහිර ක්‍රියාකාරකම්වල යෙදවීම,— විවිධ කරුණු හේතුවෙන් පාසල් සිසුන් බාහිර ක්‍රියාකාරකම්වල නොයෙදීමෙන් ඔවුන්ගේ මානසික ආතතිය වර්ධනය වී ඇති බවට සමාජ විශ්ලේෂකයන් විසින් කරුණු ඉදිරිපත් කර ඇති හෙයින් ද, ක්‍රීඩා, සංගීතය, චිත්‍ර, නැටුම් වැනි සෞන්දර්ය ක්‍රියාකාරකම් හා ගෙවතු වගාව වැනි කෘෂිකාර්මික කටයුතුවල නියැලීමෙන් සිසුන්ගේ මානසික හා කායික වර්ධනය සිදුවන බව මනෝ විද්‍යාත්මකව සනාථ වී ඇති හෙයින් ද, පවත්නා තත්ත්වය සැළකිල්ලට ගෙන පාසල් අධ්‍යාපන කටයුතු පවත්වනු ලබන සතියේ දින පහෙන් සිකුරාදා වැනි එක් දිනක් අනිවාර්ය විෂය බාහිර ක්‍රියාකාරකම්වල සිසුන් යොදවා අනාගතයේ දී ඇති විය හැකි බරපතල ගැටලු නිරාකරණය කර ගැනීමට අවකාශය සැකසීමට යෝග්‍ය වැඩසටහනක් රජය විසින් කඩිනමින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අපිරිසිදු හෝටල්, බේකරි හා ආපනශාලා ප්‍රමිතිගත කිරීම,— වෙළඳපොළේ පවතින හෝටල් හා බේකරි නිෂ්පාදනවල ප්‍රමිතිය හා පිරිසිදුකම අවම මට්ටමක පවතින හෙයින් ද, ඇතැම් බේකරි නිෂ්පාදනවල අපිරිසිදුකම හේතුවෙන් පාරිභෝගිකයන් ලෙඩරෝගවලට භාජනය වීමට වැඩි ඉඩකඩක් ඇති බවට ආපනශාලා හිමියන්ගේ සංගමයේ සභාපතිවරයා විසින් ම ප්‍රකාශ කර ඇති හෙයින් ද, මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයන්ගේ මැදිහත්වීමෙන් අපිරිසිදු හෝටල්, බේකරි හා ආපනශාලා ප්‍රමිතගත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අන්තර්ජාලය ඔස්සේ ගෙන්වන භාණ්ඩ ප්‍රමිතිකරණයකට ලක්කිරීම,— පාරිභෝගිකයන් විසින් විවිධ භාණ්ඩ හා සේවා අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් වර්තමානය වනවිට නිර්මාණය වී ඇති හෙයින් ද, එම භාණ්ඩ පරිභෝජනය කිරීමේ දී පාරිභෝගිකයන්ට ඇතිවන සංකූලතාවයන් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගැනීමේ හැකියාවක් නොමැති හෙයින් ද, මේ හේතුවෙන් සමාජය තුළ විවිධ විෂමතා හා බෙදීම් ඇති වීමෙන් ගැටුම් නිර්මාණය වීමට බොහෝ ඉඩකඩ ඇති හෙයින් ද, අන්තර්ජාලය ඔස්සේ ගෙන්වන භාණ්ඩ ප්‍රමිතිකරණයකට ලක් කිරීම සඳහා රජය විසින් ක්‍රියා කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2023

ගරු ජගත් සමරවික්‍රම මහතා,— ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සතු ඉඩම්වල කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් වගා කිරීමේ වැඩසටහනක් දියත් කිරීම,— අප රටේ රාජ්‍ය ආයතන සතු ඉඩම්වල කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් පලතුරු, එළවළු හා අලවර්ග

වගා කිරීම තුළින් අතිරේක ආදායමක් උපයා ගැනීමට හැකිවන හෙයින් ද, රටේ පවතින ආහාර හිඟයට එය පිළියමක් වන හෙයින් ද, වගා කටයුතු සඳහා උනන්දුවක් දක්වන රාජ්‍ය සේවකයන් තෝරා ගෙන ඔවුන්ට ගන්නෝරුව හා වෙනත් ප්‍රදේශවල පිහිටුවා ඇති කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවලින් විශේෂ පුහුණුවක් ලබා දී, දීප ව්‍යාප්ත ආහාර ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම හා ඉතා සාර්ථක වගාවන් තෝරා ජාතික මට්ටමින් ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2023

ගරු ජගත් සමරවික්‍රම මහතා,— කිරි ගව පාලන කටයුතු වනෝද්‍යාන තුළ සිදු කිරීම,— ශ්‍රී ලංකාව තුළ දියර කිරි හා පිටි කිරි පරිභෝජනය ඉහළ මට්ටමක පවතින හෙයින් ද, කිරි ගවයන්ට අවශ්‍ය තණකොළ සපයා ගැනීමට නොහැකිවීමෙන් කිරි ගොවීන් අධෛර්යමත් වී ඇති හෙයින් ද, දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන බැවින් කිරිපිටි ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැයවන හෙයින් ද, අනවසර ලෙස වනෝද්‍යාන තුළ කිරි ගවයන් ගාල් කිරීම හේතුවෙන් කිරි ගොවීන් අත්අඩංගුවට පත්වන හෙයින් ද, සැබෑ කිරි ගොවීන් හඳුනාගෙන ඔවුන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කොට කිරි ගව පාලන කටයුතු වනෝද්‍යාන තුළ සිදු කිරීමට රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුරුංගා වගාව ව්‍යාප්ත කිරීම,— මුරුංගා හා මුරුංගා ආශ්‍රිත නිෂ්පාදනවලට ලෝකයේ විවිධ රටවලින් මෙන්ම දේශීය වෙළඳපොළ තුළ අධික ඉල්ලුමක් ඇති හෙයින් ද, ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට මුරුංගා වගාව විශාල පිටුවහලක් වන හෙයින් ද, ශ්‍රී ලංකාවට එමඟින් විශාල විදේශ විනිමයක් උපයා ගැනීමට හැකියාවක් ඇති හෙයින් ද, මුරුංගා වගාව ව්‍යාප්ත කිරීම සඳහා වෙළඳපොළ හඳුන්වාදීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— විටමින් අවශ්‍යතාවය සම්පූර්ණ කරන පලතුරු දිවයින පුරා ප්‍රචලිත කිරීම,— ශ්‍රී ලංකාවට පලතුරු ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය වන හෙයින් ද, දිවයිනේ ඕනෑම ස්ථානයක වැවෙන පලතුරු ත්‍රිත්වයක් වන අන්නාසි, ගස්ලබු හා කෙසෙල් වර්තමානය වනවිට ආනයනය කරන හෙයින් ද, වැඩිහිටියනේග් හා ළමුන්ගේ විටමින් අවශ්‍යතාවය සම්පූර්ණ කරන මෙම පලතුරු වර්ග ත්‍රිත්වය දිවයින පුරා ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— දේශීය කුරහන් නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාවේ අතීතයේ සිට පරිභෝජනය කළ කුරහන්, විවිධ රෝගාබාධ නිවාරණය හා පාලනය කිරීමේ හැකියාවෙන් යුක්ත බව පෝෂණවේදීන් විසින් පෙන්වා දී ඇති හෙයින් ද, වර්තමානය වනවිට කුරහන් බහුල වශයෙන් මෙරටට ආනයනය කරන බැවින් ඒ සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය වන හෙයින් ද, දේශීය කුරහන්වල නව ප්‍රභේද හඳුනාගෙන ඒවා ගොවීන් අතර ප්‍රචලිත කර දේශීය කුරහන් නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම සඳහා රජය විසින් යෝග්‍ය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— විවිධ නිපුණතාවයන්ගෙන් පරිපූර්ණ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අතරින් බහුතරයක් විවිධ වෘත්තීමය නිපුණතාවයන්ගෙන් යුක්ත වූවන් වන හෙයින් ද, පරිසර හිතකාමී නිෂ්පාදන කිරීමේ හැකියාවක් සහ දැනුමක් ඔවුන් සතු වුවත් ඒ සම්බන්ධ නිසි අධ්‍යයනයක් සිදු කර නොමැති හෙයින් ද, ජාතික ආර්ථිකයට ඔවුන්ගෙන් ලබා ගත හැකි දායකත්වය සක්‍රිය ලෙස ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති හෙයින් ද, වැඩිහිටි නිවාසවල හෝ තමන්ගේ නිවෙස්වල හුදකලා දිවියක් ගතකරන මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමන්ගේ වෘත්තීන්ට ඇති නිපුණත්වයත් අදාළ නිෂ්පාදන කිරීමට උනන්දු කර එම නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීමෙන් ඔවුන්ට ආදායම් මාර්ගයක් ඇතිකිරීම හා මානසික ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට පිටුවහලක් වීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2023

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/2023

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/2023

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/2023

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කාන්තා ගෘහමූලික පවුල් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ පවුල් ඒකක අතරින් 25% ක් කාන්තා ගෘහමූලික පවුල් වන හෙයින් ද, ඉන් 50% ක් වැන්දඹුවන් වන හෙයින් ද, එම පවුල් මුහුණදෙන අභියෝග අතරින් ස්ත්‍රී- පුරුෂ සමාජභාවය හේතුවෙන් පැන නගින ගැටලු, ඉඩම් හිමිකම් ගැටලු, ජීවනෝපාය මාර්ග සීමාවීම හේතුවෙන් මුහුණ දෙන ගැටලු ප්‍රධාන තැනක් ගන්නා හෙයින් ද, දැනටමත් ජීවන වෘත්තියක යෙදී සිටින කාන්තාවන්ට ප්‍රමාණවත් පුහුණුව හා පහසුකම් නොමැතිවීම, අලෙවිකරණයේ පවතින ගැටලු, ඉඩම්වල පසු අයිතිය පැවරීමේ දී පිරිමි දරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීම හේතුවෙන් පැන නැගී ඇති ගැටලු ආදී ගැටලුකාරි තත්ත්වයන් රාශියකට මුහුණ දී ඇති හෙයින් ද, මෙම ගැටලුකාරි තත්ත්වයන්ට සාර්ථකව මුහුණදීම සඳහා තිරසර සැලැස්මක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම,— කඳුරට වතුකර කම්කරුවන් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ එහි ආර්ථිකය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබාදුන් ප්‍රජාවක් වන හෙයින් ද, ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ තම අයිතිවාසිකම් දිනා ගනිමින් එම අරගලයන් හි දී සිය ජීවිත පූජා කළ වෘත්තීය සමිති විරුවන් එක් පොදු දිනක දී සිහිපත් කිරීම මෙරට ජීවත්වන ඉන්දීය සම්භවයක් සහිත කඳුරට ජනතාවගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වන හෙයින් ද, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා සිදු කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගලයේ දී සුදු ජාතිකයෙකු විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් “මුල්ලෝයා ගෝවින්දන්” නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ හෙයින් ද, කඳුරට කම්කරු ප්‍රජාව විසින් සිදුකරන ලද අවිහිංසාවාදී අරගලයේ දී ජීවිතය පූජා කළ එම පළමු කම්කරුවා සහ ඉන් අනතුරුව කඳුරට කම්කරු ජනතා අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා දියත් කෙරුණු බොහෝ වෘත්තීය සමිති අරගලයන් හි දී ජීවිත පූජා කළ අනෙකුත් විරුවන් සැමරීම සඳහා එම පළමු වෘත්තීය සමිති විරුවා මියගිය දිනය වන ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/2023

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— 1798 වර්ෂයේදී ආරම්භ කරන ලදුව 1882 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් විධිමත් කරන ලද වසර දෙසීයකට අධික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකා තැපැල් සේවය අප රට තුළ නිදහසින් පසුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන රජය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවක් වන හෙයින් ද, කඳුරට වතුකර ජනතාව මෙරට පදිංචි වී වසර දෙසීයක පමණ කාලයක් ගත වී ඇතත් ඔවුන් පදිංචි නිවාස වෙත සෘජුව ලිපි රැගෙන ගොස් භාර දීමක් සිදු නොවන හෙයින් එම ජනතාව විවිධ අපහසුතාවන්ට පත් වී සිටින හෙයින් ද, අවුරුදු දෙසීයක කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන මෙම ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/2023

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් හට සහනදායී ක්‍රමයට ලබාදෙනු ලදුව, දැනට අත්හිටුවා ඇති වාර ප්‍රවේශ පත්‍ර නැවත ලබාදීම,— බොහෝ කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් බහුතරයක් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් වන හෙයින් ද, දිනකට එක් ගමන් වාරයක් සඳහා සිසුවෙකුට විශාල මුදලක් වැය වන හෙයින් ද, සිසුන් පාඨමාලා හැදෑරීම සඳහා පැමිණෙන්නේ දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ වන හෙයින් ද, එම සිසුන් සඳහා 2022 අධ්‍යයන වර්ෂය අවසන් වන තෙක් සහනදායී ක්‍රමයට ලබාදුන් ශිෂ්‍ය වාර ප්‍රවේශ පත්‍ර 2023 අධ්‍යයන වර්ෂයේ සිට ලබාදිම අත්හිටුවා ඇති හෙයින් ද, එම අත්හිටුවීම අවලංගු කොට සහනදායි ක්‍රමයට ලබාදුන් ශිෂ්‍ය වාර ප්‍රවේශ පත්‍ර නැවත ලබා දීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— මිනිසාට ඉතාම හිතකර මී තෙල් නිෂ්පාදනය කිරීම,— කෘෂි කර්මාන්තයට මෙන්ම මිනිසාට ද ඉතාම හිතකර මී තෙල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය මී වෘක්ෂ ව්‍යාප්ත කිරීම සඳහා වෙල් ආශ්‍රිතව මී වෘක්ෂ රෝපණය කිරීමටත්, දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි මී තෙල් පරිභෝජනය සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කිරීමටත්, මී තෙල්වල ගුණාත්මකභාවය පිළිබඳව අන්තර්ජාතික වශයෙන් දැනුම්වත් කිරීමටත්, මී තෙල් අපනයනය කිරීමටත් කඩිනම් වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/2023

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා ජීව විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග එතරම් ප්‍රගතියක් නොපෙන්වන හෙයින් ද, වාර්ෂිකව ඩෙංගු රෝගීන්ගේ වර්ධනයක් පෙන්වන හෙයින් ද, මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා නිසි විද්‍යාත්මක ක්‍රම අනුගමනය නොකළහොත් මදුරු දඟර නිෂ්පාදන සමාගම් බහුලව අවශ්‍ය වීම සහ මදුරු දඟර අලෙවි කිරීම සඳහා භාවිත කරන ආකර්ශණීය වෙළඳ දැන්වීම් හේතුවෙන් ජනතාව නොමඟ යෑම ද වැළැක්විය නොහැකි හෙයින්, ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා අදාළ අංශ ද සහභාගි කර ගනිමින් ජීව විද්‍යාත්මක වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මරගල පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම,— මොනරාගල නගරයේ හා තදාසන්නව පදිංචි පවුල් 4000කට වැඩි සංඛ්‍යාවකට පානීය ජලය සැපයීම මරගල කඳුවැටියේ පිහිටි ජල මූලාශ්‍රවලින් සිදු වන හෙයින් ද, ඉංග්‍රීසි පාලන සමයේ තේ හා කෝපි වගා කර තිබූ මෙම කඳු පන්තියේ වර්තමානය වනවිට ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ රබර් වගා කර ඇති හෙයින් ද, මෙහි පේළි නිවාසවල විශාල පිරිසක් ජීවත්වන හෙයින් ද, මෙහි නව නිවාස ඉදිකිරීම සඳහාත්, වගා කටයුතු සඳහාත් කැලෑ එළි කිරීම හා කැලෑ ගිනි තැබීම විශාල පාරිසරික ගැටලුවක් බවට පත් වී ඇති හෙයින් ද, මෙසේ විනාශ වෙමින් පවතින පරිසර පද්ධතිය හා ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම සඳහා ගැසට් නිවේදනයක් මඟින් මෙම ප්‍රදේශය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස නම් කර ඇති හෙයින් ද, මෙම ප්‍රදේශය එළි පෙහෙළි කිරීම හා නිවාස ඉදිකිරීම නවතා දැමීමටත් දෙවැනි හා තෙවැනි පරම්පරා සඳහා වෙනත් සුදුසු ප්‍රදේශවලින් විකල්ප ඉඩම් ලබාදීමටත් අවශ්‍ය කටයුතු රජය විසින් කඩිනමින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— දේශීය වෛද්‍ය කටයුතු වෙනුවෙන් වෛද්‍ය සභාවක් ස්ථාපිත කිරීම,— ලෝකයේ විශිෂ්ට සංස්කෘතියක් සහිත ශ්‍රී ලංකාවේ අවුරුදු දෙදහස් පන්සියයක ඉපැරණි ඉතිහාසයක් පුරා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සුවපත් කරන ලද දේශීය පාරම්පරික වෛද්‍යවරුන් හා හෙළ වෙදකමේ අනාගතය රටේ අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීම අවශ්‍ය වන හෙයින්, දේශීය හෙළ වෙදකම ආරක්ෂා කර ගැනීමේ අරමුණින් මෙම වෛද්‍ය ක්‍රමය හා වෛද්‍යවරුන් ආරක්ෂා කොට සුරක්ෂිත කර පෝෂණය කිරීම සඳහා දේශීය වෛද්‍යවරුන් අතරින් දේශීය වෛද්‍ය සභාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/2023

ගරු මයන්ත දිසානායක මහතා,— දුෂ්කර හා අඩු පහසුකම් සහිත ප්‍රදේශවල පිහිටි විනාශයට පත්ව ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීම,— උතුරු හා වන්නි ප්‍රදේශවල සහ දුෂ්කර ප්‍රදේශවල විනාශයට පත්ව ඇති පන්සල් සහ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමට හා එම ස්ථාන සඳහා රාජ්‍ය අරමුදලක් යොදවා සංවර්ධන කටයුතු කිරීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/2023

ගරු මයන්ත දිසානායක මහතා,— අතරමං වූ විදේශගත ශ්‍රමිකයන් සුරක්ෂිතව මෙරටට ගෙන්වා ගැනීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය උපයා දෙනු ලබන්නේ විදේශ ශ්‍රමිකයන් වන හෙයින් ද, ව්‍යාජ ලෙස ශ්‍රමිකයන් විදේශගත කරවීමේ නිරතවන ජාවාරම්කරුවන් හේතුවෙන් ශ්‍රමිකයන් මැදපෙරදිග බොහෝ රටවල අසරණ තත්ත්වයට පත්ව ඇති හෙයින් ද, ඔවුන් සුරක්ෂිතව මෙරටට ගෙන්වා ගැනීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/2023

ගරු මයන්ත දිසානායක මහතා,— ආක්‍රමණික වල්පැළෑටි හේතුවෙන් වික්ටෝරියා ජලාශයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හා වික්ටෝරියා ඇතුළු ජලාශවලට ආක්‍රමණික වල්පැළෑටිවලින් අධික හානියක් සිදුවන හෙයින් ද, දැනටමත් වික්ටෝරියා ජලාශයේ ඇතැම් කලාපවලට ඉන් බලපෑම් සිදු වී ඇති හෙයින් ද, මෙම ආක්‍රමණික වල්පැළෑටි ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/2023

ගරු මයන්ත දිසානායක මහතා,— දේශීය වී වර්ග වගා කිරීම ප්‍රවර්ධනය කිරීම හා නව වී ප්‍රභේදයන් හඳුන්වාදීම,— දේශීය වී වර්ග පිළිබඳ ගොවි මහතුන් දැනුම්වත් කර එම වී වගා කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් සපයා දීම සහ ලෝකයේ අලුතෙන් බිහිකරන වැඩි අස්වැන්නක් ලබා දෙන වී ප්‍රභේද මෙරටට ගෙන්වා පර්යේෂණ සිදුකර දේශීය ගොවීන්ට ඒවා ලබා දී වගා කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/2023

ගරු මයන්ත දිසානායක මහතා,— තරුණ ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම,— විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් අතරින් ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා බැංකු පද්ධතිය හරහා සහනදායී පොළී අනුපාතයක් යටතේ ඔවුන්ට ණය පහසුකම් සැපයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/2023

ගරු හේෂා විතානගේ මහතා,— ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාවය,— කවර රටක කවර ක්ෂේත්‍රයක වුව ද අන්තවාදී අදහස් තිබීම ඉතා හානිකර වන හෙයින් ද, ආගමික අන්තවාදය පිළිබඳව පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පසුව සමාජයේ විශාල කථිකාවතක් ඇති වී තිබෙන හෙයින් ද, ආගමික අන්තවාදය මතුවීම හා ප්‍රවර්ධනය කිරීම වැළැක්වීම සහ එයට දැනටමත් ගොදුරු වී සිටින පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/2023

ගරු හේෂා විතානගේ මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින් රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/2023

ගරු හේෂා විතානගේ මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සළකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, හම්බනේතාට සහ බදුල්ල ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා72/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය (Z- Score) මත සියලුම රාජ්‍ය අංශයේ රැකියා පුරප්පාඩු පිරවීම,— රාජ්‍ය සේවයට බඳවාගැනීමේ දී පැවති හා පවත්නා ආණ්ඩු විසින් දේශපාලන පක්ෂපාතීත්වය මත හෝ රුචි අරුචිකම් මත අනුගමනය කරන ලද ප්‍රතිපත්ති රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට බරපතල හානියක් සිදු කර ඇති හෙයින් ද, ඒ හේතුවෙන් දැඩි දේශපාලනීකරණයට ගොදුරු වී ඇති රාජ්‍ය සේවය මුළුමනින්ම ස්වාධීන කර ගැනීමට අවශ්‍ය වන හෙයින් ද, අධ්‍යාපන සුදුසුකම් මත පමණක් රැකියා ලබා දීමේදී දක්ෂ හා සුදුසුකම් සහිත දරුවන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටුවන බැවින් තරුණ අසහනය මුලිනුපුටා දැමීමට ඉන් හැකිවන හෙයින් ද, දිස්ත්‍රික්කය තුළ ඇතිවන පුරප්පාඩු අදාළ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට හිමිවීම හරහා රැකියාලාභීන්ගේ ආර්ථික සුරක්ෂිතතාව

මෙන්ම ඉහළ කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය අංශයට ලබා ගැනීමට අවකාශ උදාවන හෙයින් ද, සියලුම රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල සහ පළාත් සභා අනුබද්ධ සියලු ආයතනයන් හි රැකියා පුරප්පාඩු පිරවීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය සැලකිල්ලට ගැනීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා73/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන හෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා74/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා 2023 වර්ෂය වනවිට පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යාපීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් 2020 පෙබරවාරි 13 දින මවිසින් ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා75/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට ලබා දීම,— ශ්‍රී ලංකාවේ අවසන් වරට පවත්වනු ලැබූ ජන සංගණනයට අනුව මෙරට ආබාධ සහිත ප්‍රජාව මුළු ජනගහනයෙන් 8% ඉක්මවා ගොස් ඇති හෙයින් ද, ග්‍රාමීය පරිපාලනය සිදුවන පළාත් පාලනයේ සිට ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන පාර්ලිමේන්තුව දක්වා මහජන නියෝජිත ආයතනවලට ආබාධ සහිත ප්‍රජාව තේරී පත්වීමට අල්ප අවකාශයක් හිමි ව ඇති හෙයින් ද, ආබාධ සහිත මෙරට පුරවැසියන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සිදුව ඇත්තේ ද සිදුවන්නේ ද දියුණු රටවල සංකල්පවලට අනුව නොවන හෙයින් ද, සියලුම මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ නාම යෝජනා සැකසීමේ දී අවම වශයෙන් 5% ක නියෝජනයක් ආබාධ සහිත පුරවැසියන්ට හිමිවන සේ රජය විසින් අදාළ පනත් හා නීති සංශෝධනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා76/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව “බ්‍රේල්” ක්‍රමයට හා “ශ්‍රවණ” (Audio) ආකාරයට සකස් කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඕනෑම රටක මූලික නීතිය හා රාජ්‍යයේ මූලික ආකෘතිය වන හෙයින් ද, මිලියන විසිදෙකකට ආසන්න වූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක් ආබාධ සහිත ප්‍රජාව වන හෙයින් ද, ආබාධ ප්‍රජාව අතරින් ද ලක්ෂ හයකට ආසන්න ප්‍රමාණයක් ශ්‍රවණාබාධ සහ දෘශ්‍යාබාධ සහිත පුරවැසියන් වන හෙයින් ද, රටේ මූලික නීතිය පිළිබඳ දැනීමක් හා අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම ශ්‍රවණ සහ දෘශ්‍යාබාධ සහිත ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව “බ්‍රේල්” ක්‍රමයට හා “ශ්‍රවණ” (Audio) ආකාරයට සකස් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා77/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— 50% බැගින් ජාතික කුසලතාවට අදාළව සහ පාසැල් පදනමට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසු සිසුවියන් තෝරා ගැනීමේ දර්ශකය වන Z-අගය (Z- Score) ගණනය කිරීම,— අ.පො.ස. උසස් පෙළ සමත් සිසු සිසුවියන් අතරින් කලා පීඨ හැර අනෙකුත් විශ්වවිද්‍යාල පීඨ සඳහා සිසුන් බඳවා ගැනීමේ පදනම හා දර්ශකය Z-අගය මත සකස් කර ඇති හෙයින් ද, මෙම ක්‍රමවේදයට අනුව Z-අගයෙන් 40% ක් ජාතික කුසලතාව (national Merits) මත පදනම්ව ද 55% ක් දිස්ත්‍රික් පදනම (district basis) මත පදනම්ව ද 5% ක් අති දුෂ්කර දිස්ත්‍රික්ක (remote districts) මත පදනම්ව ගණනය කරනු ලබන හෙයින් ද, ඕනෑම දිස්ත්‍රික්කයක ඇති සියලුම පාසැල් සඳහා සමාන ලකුණු මට්ටමක් හෝ අගයක් ආදේශ කිරීම යුක්ති සහගත හෝ සාධාරණ නොවන හෙයින් ද, දිස්ත්‍රික්ක හා අති දුෂ්කර දිස්ත්‍රික්ක පදනම වෙනුවට පාසැල් පදනම වශයෙන් ආදේශ කොට පාසැල් පද්ධතිය තුළ ඇති උසස් පෙළ විෂය ධාරාවන් සහිත පාසැල් තුන්දහස් හතලිස් දෙක (3042) කාණ්ඩ කිහිපයකට වර්ගීකරණය කොට විශ්වවිද්‍යාල ජාතික කුසලතාවට අනුව 50% ක් ද පාසැල් පදනමට අදාළව 50% ක් ද වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා Z-අගය ගණනය කිරීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා78/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීම,— ශ්‍රී ලාංකික සිංහල සමාජයේ පුද්ගල නාමකරණයේ දී වාසගම බොහෝවිට යෙදී ඇත්තේ වැඩවසම් සමාජය තුළ තිබූ රාජකාරි සහ රාජ මෙහෙවරට පසුබිම්ව වන හෙයින් ද, ඇතැම් වාසගම් යෙදී ඇත්තේ මෙම රාජකාරිවලට අදාළ කුලය ඉස්මතු වන හෙයින් ද, අධිකරණ කටයුත්තකට හෝ මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද දායකයා කැඳවන විටදී හෝ විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයක දී උපාධි අපේක්ෂකයා කැඳවන විට දී හෝ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගම ශබ්ද නගා ප්‍රකාශ කිරීම හේතුවෙන් බොහෝ පුද්ගලයන් දැඩි අපහසුතාවයට පත්වන හෙයින් ද, වර්තමාන පරම්පරාව විසින් ප්‍රතික්ෂේප කරන නූතන ලෝකයට ආදේශ කළ නොහැකි මෙම නීතිය, සිරිත හෝ සම්ප්‍රදාය ඉවත් කොට ජනතාව ඉදිරියේ පුද්ගල නාමකරණය ප්‍රසිද්ධියේ ශබ්ද නගා සිදු කරන අවස්ථාවලදී මුල් නම සමඟ වාසගමේ මූලික සංකේත අකුරු හෝ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් සඳහන් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා79/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම,— 1980 දශකයේ දී ආරම්භ කරන ලද නිල්වලා ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ හා නිල්වලා නිම්නයේ ජීවත්වන ජනතාවගේ දෛනික ජීවිතය හා ආර්ථිකය බරපතල අර්බුදයකට පත්වී ඇති හෙයින් ද, ඌරුබොකු ඔය සහ කිරම ආර හම්බන්තොට ශුෂ්ක කලාපයට හැරවීම, පහළ නිම්නයේ බටුවිට ජලාශය, අතුරලිය ජලාශය, කඩවැද්දුව ජලාශය සහ දෙදියගල ජලාශය නිර්මාණය කිරීම සහ ආරක්ෂිත කලාපය හා අනාරක්ෂිත කලාප පිළිබඳ නැවත අධ්‍යයනය කොට අත්හරින ලද වෙළි (bunts) නැවත ඉදිකිරීම ප්‍රමුඛ කොටගත් මාතර හා හම්බන්තොට ප්‍රදේශවලට සෘජුවම බලපාන නිල්වලා ගඟ සංවර්ධන ව්‍යාපෘතියේ මූලික සැලසුම් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් එළිදැක්වීම,— මානව පරිණාමයේ සිට පුරාවිද්‍යාව, සාහිත්‍යය, ජනශ්‍රැතිය, රෝම, ග්‍රීක හා පර්සියානු ඉතිහාසය අධ්‍යයනය කොට ශ්‍රී ලාංකික ඉතිහාසය පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රවීණ කර්තෘ මණ්ඩලයක් යටතේ රාජ්‍ය අනුග්‍රහයෙන් එළිදැක්වීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.